# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/38 – 2022 මාර්තු මස 30 වැනි බදාදා – 2022.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 92 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2019/WS/474.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: MILL/LND/4/ACQVI/104.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 24 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, මිල්ලනිය.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 644C - රද්දෙගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රද්දෙගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KA/DSO/2019/680 හා 2020.12.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මාරගහලන්දේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0177**

උතුරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි හීනටිදෙණියකුඹුර, අංගගේ පියසේන පෙරේරා හිමිකම් කියන මාරගහලන්දේවත්ත, හිමිකම් කියන්නා සොයාගත නොහැකි මාරගහන්දේවත්ත, සුජී ප්‍රේමකුමාර හිමිකම් කියන මාරගහලන්දේවත්ත සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි මාරගහන්දේවත්ත; නැගෙනහිරට:


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අංගගේ පියසේන පෙරේරා හිමිකම් කියන මාරගහලන්දේවත්ත, හිමිකම් කියන්නා සොයාගත නොහැකි මාරගහන්දේවත්ත, සුජී ප්‍රේමකුමාර හිමිකම් කියන මාරගහලන්දේවත්ත, හිමිකම් කියන්නා සොයාගත නොහැකි මාරගහන්දේවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ චාලට් සන්දනායක, ලොකුලියනගේ මුදිත කුමාර අල්විස් සහ තවත් අය හිමිකම් කියන මාරගහලන්දේවත්ත; බටහිරට: චාලට් සන්දනායක, ලොකුලියනගේ මුදිත කුමාර අල්විස් සහ තවත් අය හිමිකම් කියන මාරගහලන්දේවත්ත සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි හීනටිදෙණියකුඹුර.

EOG 03 - 1057

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.